# මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## IFB අංකය : ITM/2/1/02/03/2025/NCB/02

1. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු ලිපි ලේඛනයෙහි අවශ්‍යතා උපලේඛනයෙහි (V කොටස) දක්වා ඇති ආකාරයට මුදල් අමාත්‍යාංශය සඳහා කාර්යාල ඵලදායිතා කට්ටලය සහිත විද්‍යුත් තැපැල් විසඳුමක් (Email Solution With Office Productivity suite) සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කරවීම සහ නඩත්තු කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

   ගෙනවිත් භාරදීමේ සහ ස්ථාපනය කිරීමේ කාලය : ප්‍රදානය කරන ලද දිනයේ සිට මාස 02 ක් ඇතුළත

2. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි දක්වා ඇති ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) හරහා ලංසුකරණය මෙහෙයවෙන අතර මාර්ගෝපදේශයන්හි අර්ථ දක්වා ඇති සියලුම යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට මෙම ලංසුකරණය විවෘත වේ.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු කොළඹ 01, මහ ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ (මූල්‍ය) ඩී. පී. ජේ. ප්‍රදීප් මහතා දුරකථන අංක 0112-484582 වෙතින් ලබාගත හැකි අතර 2025 අගෝස්තු 04 වන දින පටන් වැඩකරන දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

4. සුදුසුකම්

   මිල ගණන් ඉදිරිපත් කරන ලද කාර්යාල ඵලදායිතා කට්ටලය සහිත විද්‍යුත් තැපැල් විසඳුම (Email Solution With Office Productivity Suite) ශ්‍රී ලංකාව තුළ සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කරවීම සහ නඩත්තු කිරීම පිළිබඳ අවම වසර 5 ක පළපුරුද්දක් ලංසුකරු සතුවිය යුතු අතර අවසාන වසර 05 තුළ (2020, 2021, 2022, 2023) අවම වශයෙන් රාජ්‍ය අංශයේ (අධ්‍යාපනික ආයතන හැර) ව්‍යාපෘති තුනක් සාර්ථකව නිම කර තිබිය යුතු අතර, අවම වශයෙන් ඉන් එකක ක්‍රියාකාරී පරිශීලක ගිණුම් අඩුම තරමින් 500 ක් තිබිය යුතුය.

   - අවසාන මූල්‍ය වර්ෂ 3 තුළදී (2021 - 2022, 2022 - 2023, 2023-2024) ක්‍රියාත්මක වෙමින් පවතින හෝ සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්තු සඳහා ලැබුණු මුළු සහතික කළ ගෙවීම් ලෙස ගණනය කරන ලද අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම ලංකා රුපියල් මිලියන 100 ක් විය යුතුය.
   - ලංසුකරු විසින් ද්‍රවශීල වත්කම්, බැර නොකළ සැබෑ වත්කම්, ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය ක්‍රම වැනි මූල්‍ය සම්පත් වෙත ප්‍රවේශය හෝ ලබාගත හැකි බව පෙන්නුම් කළ යුතුය. ඕනෑම ගිවිසුම්ගත අත්තිකාරම් ගෙවීමක් සහ මෙම ව්‍යාපෘතිය සඳහා ලංසුකරුගේ අනිකුත් වගකීම් හැර තිබිය යුතු මුදල් ප්‍රවාහයේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා රුපියල් මිලියන විස්ස (ලං. රු. මිලියන 20) ට නොඅඩු හෝ සමාන විය යුතුය.
   - ස්ථාපනය කිරීම සහ සහාය සඳහා අධ්‍යාපනිකව සහ තාක්ෂණිකව සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් ලංසුකරු සතු විය යුතුය.

5. නැවත නොගෙවන ගාස්තු රු. 20,000 (ලං.රු. 20,000) ක් ගෙවීමෙන් අනතුරුව පහත සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් කළ යුතුය.

6. ලංසු 2025 අගෝස්තු 25 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2025 අගෝස්තු 25 වන දින ප.ව. 2.30ට පහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන සහ මාර්ගගතව සහභාගී වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග රු. 1,200,000 (ලං.රු. 1,200,000) "ලංසු සුරක්ෂණය" අමුණා එවිය යුතුය.

7. පූර්ව ලංසු රැස්වීමක් 2025 අගෝස්තු 13 වන දින පෙ.ව. 10.00ට මුදල් අමාත්‍යාංශය, බිම් මහල, රන් දෙර ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන අතර, අභිලාෂී ලංසුකරුවන්ට ඒ සඳහා සහභාගී විය හැක.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව,**
**මුදල් අමාත්‍යාංශය, කාමර අංක 27,**
**මහලේකම් කාර්යාලය, කොළඹ 01.**